# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**2022 සැප්තැම්බර් මස 02 වන දින**

**II වන කොටස**

**අතිරේකය**

**(2022. 09. 07 දින නිකුත් කරන ලදී)**


# යුනෙස්කෝ සඳහා වූ ශ්‍රී ලංකා ජාතික කොමිෂන් සභාව

**එක්සත් ජාතීන්ගේ අධ්‍යාපනික, විද්‍යාත්මක සහ සංස්කෘතික සංවිධානය (යුනෙස්කෝ) සඳහා ශ්‍රී ලංකා ජාතික කොමිෂන් සභාවක් පිහිටුවීම සඳහා ද; ඊට සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනත් කෙටුම්පතකි**

අධ්‍යාපන අමාත්‍යතුමාගේ නියමය පරිදි පළකරන ලදී


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

**මිල : රු. 45.00** **තැපැල් ගාස්තුව : රු. 15.00**

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# යුනෙස්කෝ සඳහා වූ ශ්‍රී ලංකා ජාතික කොමිෂන් සභාව

එල්.ඩී.-ඕ. 46/2008

**එක්සත් ජාතීන්ගේ අධ්‍යාපනික, විද්‍යාත්මක සහ සංස්කෘතික සංවිධානය (යුනෙස්කෝ) සඳහා ශ්‍රී ලංකා ජාතික කොමිෂන් සභාවක් පිහිටුවීම සඳහා ද; ඊට සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :-

ලුහුඬු නාමය

1. මේ පනත 2022 අංක    දරන යුනෙස්කෝ සඳහා වූ ශ්‍රී ලංකා ජාතික කොමිෂන් සභාව පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

## I වන කොටස

## යුනෙස්කෝ සඳහා වූ ශ්‍රී ලංකා ජාතික කොමිෂන් සභාව පිහිටුවීම

යුනෙස්කෝ සඳහා වූ ශ්‍රී ලංකා ජාතික කොමිෂන් සභාව පිහිටුවීම

**2.** (1) (මෙහි මින්මතු "කොමිෂන් සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) යුනෙස්කෝ සඳහා වූ ශ්‍රී ලංකා ජාතික කොමිෂන් සභාව යනුවෙන් හඳුන්වනු ලබන කොමිෂන් සභාවක් පිහිටවනු ලැබිය යුතු ය.

(2) කොමිෂන් සභාව, (1) වන උපවගන්තියෙන් ඊට පවරා ඇති නාමයෙන්, අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් සහිත සංස්ථාවක් විය යුතු අතර ඒ නාමයෙන් එය විසින් ද එයට එරෙහිව ද නඩු පවරනු ලැබිය හැකි ය.

කොමිෂන් සභාවේ අරමුණු

3. කොමිෂන් සභාවේ අරමුණු පහත දැක්වෙන පරිදි විය යුතු යː-

(අ) යුනෙස්කෝහි ප්‍රවීනතා ක්ෂේත්‍රයට අදාළ ලොවපුරා සම්බන්ධතාවයක් ඇති ජාල පද්ධතියක සුසාධනය හරහා ජාත්‍යන්තර හා බුද්ධිමය සහයෝගිතාව සඳහා අවශ්‍ය පොදු සංසදයක් සඳහා විධිවිධාන සැලැස්වීම;

(ආ) යුනෙස්කෝ විසින් සංවිධානය කරනු ලබන දේශීය, ප්‍රාදේශීය සහ ගෝලීය වැඩසටහන් හරහා අධ්‍යාපනය, විද්‍යාව, සංස්කෘතිය, ජනමාධ්‍ය සහ සන්නිවේදනයට අදාළ

ක්ෂේත්‍රවල තොරතුරු හුවමාරු කර ගැනීම සඳහා පහසුකම් සැලසීම සහ එමගින් යුනෙස්කෝහි ප්‍රවීනතා පිළිබඳ අදාළ ක්ෂේත්‍රවල තොරතුරු සඳහා නිෂ්කාශන මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියා කිරීම;

(ඇ) ශ්‍රී ලංකාව පාර්ශ්වකරුවකු වන යුනෙස්කෝ සම්මුතීන්වල පුළුල් පරාසයක අන්තර්ගත කර ඇති මාර්ගෝපදේශ ක්‍රියාත්මක කිරීමේ දී ඒවා ඉදිරියට කරගෙන යාම සහ අධීක්ෂණය කිරීම සඳහා අදාළ අමාත්‍යාංශවලට සහාය වීම;

(ඈ) යුනෙස්කෝ අර්ථලාභීන් අතර පර්යේෂණ ලේඛනවලින්, ප්‍රකාශනවලින් සහ යහපත් පරිචයන්ගෙන් ලබාගත් තොරතුරු හරහා දැනුම අත්පත් කර ගැනීමට අවස්ථාව සලසන ක්‍රමෝපායන් වෙත ප්‍රවේශ වීමට දිරිගැන්වීම සහ ඊට පහසුකම් සැලසීම; සහ

(ඉ) වැඩමුළු, සම්මන්ත්‍රණ සහ සම්මේලන පැවැත්වීම මගින් අධ්‍යාපනය, විද්‍යාව, සංස්කෘතිය, ජනමාධ්‍ය සහ සන්නිවේදනය යන ක්ෂේත්‍රවලට අදාළ ජාතික ආයතනවල හැකියාවන් ගොඩනැගීම සඳහා සහාය වීම.

කොමිෂන් සභාවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය

**4.** කොමිෂන් සභාවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය පහත දැක්වෙන පරිදි විය යුතු ය:-

(අ) යුනෙස්කෝ වැඩසටහන් සහ ව්‍යාපෘතිවලට අදාළ වන්නා වූ කාරණා පිළිබඳව ශ්‍රී ලංකා ආණ්ඩුවට උපදෙස් ලබා දීම;

(ආ) යුනෙස්කෝ වැඩසටහන් සහ ව්‍යාපෘතිවල අරමුණු, කර්තව්‍ය සහ පරමාර්ථ පිළිබඳව අවබෝධයක් ශ්‍රී ලංකාවේ යුනෙස්කෝ අර්ථලාභීන් අතර ප්‍රවර්ධනය කිරීම සහ එවැනි තොරතුරු බෙදාහැරීම සහ එම කාර්යය සඳහා රැස්වීම්, සම්මන්ත්‍රණ සහ දේශන පැවැත්වීම;

(ඇ) අදාළ රජයේ සහ දේශීය ස්වාධීන ආයතනවල, ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධානවල, එක්සත් ජාතීන්ගේ නියෝජ්‍යායතනවල, රාජ්‍ය සහ රාජ්‍ය නොවන සංවිධානවල, පෞද්ගලික හා රාජ්‍ය අංශයේ ආයතනවල

සහයෝගීතාවය ඇතිව කොමිෂන් සභාවේ අරමුණු ඉටුකර ගැනීම සඳහා ක්‍රියා කිරීම;

(ඈ) අදාළ අමාත්‍යාංශ තුළ හැකියාවන් ගොඩනැංවීම අරමුණු කරගත් වැඩසටහන් ඇතුළුව අධ්‍යාපනය, විද්‍යාව, සංස්කෘතිය, ජනමාධ්‍ය, සන්නිවේදනය සහ වෙනත් අදාළ ශික්ෂාවන් පිළිබඳ ක්ෂේත්‍රවල වැඩසටහන් සංවිධානය කිරීම සහ එවැනි වැඩසටහන් අධීක්ෂණය කිරීමට සහ ඇගයීමට සහාය වීම;

(ඉ) එක්සත් ජාතීන්ගේ පද්ධති සමග ඇති කරගත් සහභාගීත්වයන් ඇතුළුව රාජ්‍ය, පෞද්ගලික සහ රාජ්‍ය නොවන පරදු දරන්නන් සමග සහභාගීත්වයන් වැඩිදියුණු කිරීම;

(ඊ) යුනෙස්කෝ ප්‍රදාන, සම්මාන සාමාජිකත්ව සහ අධ්‍යයන ආධාර සඳහා තොරතුරු ප්‍රචලිත කිරීම සහ අපේක්ෂකයන් නිර්දේශ කිරීම;

(උ) වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා අරමුදල් ඒකරාශී කිරීම සහ ලබා ගැනීම;

(ඌ) ඕනෑම බැංකුවක හෝ බැංකුවල ජංගම, ඉතිරිකිරීමේ සහ තැන්පතු ගිණුම් ආරම්භ කිරීම සහ පවත්වාගෙන යාම;

(එ) කොමිෂන් සභාවේ කර්තව්‍ය ඉටුකිරීම සඳහා මුදලින් හෝ අන්‍යාකාරයකින් දේශීය හෝ විදේශීය මූලාශ්‍රවලින් ලැබෙන ත්‍යාග, ප්‍රදාන හෝ පරිත්‍යාග භාරගැනීම:

එසේ වුව ද, මේ පනතේ වෙනත් යම් විධිවිධානවල කුමක් සඳහන් වුව ද, කොමිෂන් සභාව විසින්, මුදලින් ලැබෙන සියලුම විදේශ ප්‍රදාන, ත්‍යාග හෝ ආධාර සම්බන්ධයෙන්, විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ පූර්ව ලිඛිත අනුමතය ලබා ගත යුතු ය;

(ඒ) කොමිෂන් සභාවේ කර්තව්‍ය ඉටුකිරීම සඳහා යම් චංචල හෝ නිශ්චල දේපළ අත්කර ගැනීම සහ දැරීම, බද්දට ගැනීම හෝ දීම, උකස් කිරීම හෝ කුලියට දීම, ඔඩපනය කිරීම හෝ විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම; සහ

(ඔ) කොමිෂන් සභාවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටුකිරීම සඳහා අවශ්‍ය විය හැකි සියලු ගිවිසුම්වලට ඇතුළත් වීම සහ ඒවා ඉටුකිරීම.

**කොමිෂන් සභාවේ සංයුතිය**

**5.** කොමිෂන් සභාව පහත දැක්වෙන තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු යː-

(අ) පහත දැක්වෙන නිලබලයෙන් පත්වන සාමාජිකයන්, එනම් ː-

(i) අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ එම අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයකු;

(ii) උසස් අධ්‍යාපන විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ එම අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයකු;

(iii) තාක්ෂණ විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ එම අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයකු;

(iv) සංස්කෘතික සහ ආගමික කටයුතු පිළිබඳ විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ එම අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයකු;

(v) ජනමාධ්‍ය විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ එම අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයකු;

(vi) මුදල් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ එම අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයකු;

(vii) විදේශ සබඳතා විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ එම අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයකු;

(viii) පරිසර විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ එම අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයකු;

(ix) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත මගින් පිහිටුවනු ලැබූ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිවරයා;

(x) යුනෙස්කෝ සඳහා වූ ශ්‍රී ලංකා ජාතික කොමිෂන් සභාවේ මහලේකම්වරයා;

(xi) 1994 අංක 11 දරන විද්‍යා හා තාක්ෂණ සංවර්ධන පනත මගින් පිහිටුවනු ලැබූ ජාතික විද්‍යා පදනමේ සභාපතිවරයා; සහ

(ආ) අධ්‍යාපනය, ස්වභාවික විද්‍යාව, සමාජ සහ මානව විද්‍යාව, තාක්ෂණවේදය, සංස්කෘතිය, ව්‍යාපාර හා කර්මාන්ත, සන්නිවේදනය, සාමය, මානව අයිතිවාසිකම්, නීතිය, රාජ්‍ය පරිපාලනය, ජනමාධ්‍යවේදය, පාරිසරික ආරක්ෂාව, රංග කලාව, සංගීතය හෝ සාහිත්‍ය යන ක්ෂේත්‍රවල විශිෂ්ටත්වයක් දක්වා ඇති තැනැත්තන් අතුරින් අමාත්‍යවරයා විසින් පත්කරනු ලබන (මෙහි මින්මතු "පත්කළ සාමාජිකයන්" යනුවෙන් සඳහන් කරනු ලබන) සාමාජිකයන් තුන්දෙනෙකු.

කොමිෂන් සභාවේ සභාපතිවරයා සහ උපසභාපතිවරයා

**6.** (1) අමාත්‍යවරයා කොමිෂන් සභාවේ සභාපතිවරයා විය යුතු ය.

(2) අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා කොමිෂන් සභාවේ උපසභාපතිවරයා විය යුතු ය.

(3) උපසභාපතිවරයා, කොමිෂන් සභාව සඳහා පත්කිරීමට අදාළ වූ ධුරය දරනු ලබන තාක් කොමිෂන් සභාවේ ධුර දැරිය යුතු ය.

(4) රෝගාතුරවීම, වෙනත් අශක්නුතාවයක්, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනත් යම් හේතුවක් නිසා සභාපතිවරයාට සිය ධුරයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටුකිරීමට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක, උපසභාපතිවරයාට සිය ධුරයේ සාමාන්‍ය කාර්යන්ට අතිරේකව, සභාපතිවරයා වශයෙන් කටයුතු කළ හැකි ය.

කොමිෂන් සභාවේ සාමාජිකයකු වශයෙන් පත් කිරීමට හෝ දිගටම කටයුතු කිරීමට නුසුදුසුකම්

**7.** යම් තැනැත්තකු -

(අ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු, යම් පළාත් සභාවක මන්ත්‍රීවරයකු හෝ පළාත් පාලන ආයතනයක සභිකයකු වේ නම් හෝ වුවහොත්;

(ආ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන්නේ නම් හෝ පුරවැසියකුව සිටීම අවසන් වුවහොත්;

(ඇ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලපවත්නා යම් නීතියක් යටතේ බංකොලොත් හෝ බුන්වත් තැනැත්තකු බවට ප්‍රකාශ කරනු ලැබ ඇත්නම්;

(ඈ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බලපවත්වන යම් නීතියක් යටතේ සිහිවිකල් තැනැත්තකු බවට නිශ්චය කොට ඇත්නම් හෝ සලකනු ලැබ ප්‍රකාශයට පත් කරනු ලැබ ඇත්නම්;

(ඉ) චරිත දූෂණ වරදකට වරදකරු කරනු ලැබ මාස හයකට නොඅඩු කාලයකට බන්ධනාගාරගත කිරීමේ දඬුවමක් ලැබ ඇත්නම්;

(ඊ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක යම් අධිකරණයක් මගින් පනවන ලද සිර දඬුවමක් වූ දඬුවමක් ඔහු වෙත ප්‍රදානය කරන්නේ නම් හෝ ප්‍රදානය කර ඇත්නම්;

(උ) කොමිෂන් සභාව විසින් හෝ කොමිෂන් සභාව වෙනුවෙන් සාදන ලද යම් ගිවිසුමක් යටතේ යම් අයිතියක් හෝ ප්‍රතිලාභයක් දරයි නම් හෝ භුක්ති විඳියි නම්;

(ඌ) කොමිෂන් සභාවේ සාමාජිකයකු වශයෙන් ඔහුගේ කර්තව්‍ය ඉටුකිරීමේ දී ඊට අහිතකර වන ආකාරයකින් බලපෑ හැකි යම් මූල්‍යමය හෝ වෙනත් සබඳතාවක් ඇත්නම්; හෝ

(එ) කොමිෂන් සභාවේ අනුමතයකින් තොරව කොමිෂන් සභාවේ අනුගාමී රැස්වීම් තුනකට නොපැමිණ සිට ඇත්නම්,

එම තැනැත්තා කොමිෂන් සභාවේ සාමාජිකයකු ලෙස පත්කිරීමට හෝ දිගටම කටයුතු කිරීමට නුසුදුස්සෙකු විය යුතු ය.

කොමිෂන් සභාවේ පත්කළ සාමාජිකයන්ගේ ධුරකාලය

**8.** කොමිෂන් සභාවේ සෑම පත්කළ සාමාජිකයකුම මියයාමෙන්, ඉල්ලා අස්වීමෙන් හෝ ඉවත් කිරීමෙන් කලින් ධුරය හිස් කළහොත් මිස, පත්කිරීමේ දින සිට අවුරුදු තුනක කාලසීමාවක් සඳහා ධුර දැරිය යුතු අතර, ඔහු ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස, තවදුරටත් වූ අනුගාමී හෝ අන්‍යාකාරයෙන් වන ධුර කාල එකක කාලසීමාවකට යටත්ව නැවත පත් කරනු ලැබීමට සුදුස්සකු විය යුතු ය.

පත්කළ සාමාජිකයන් ඉවත් කිරීම, ඉල්ලා අස්වීම ආදිය

**9.** (1) කොමිෂන් සභාවේ ඕනෑම පත්කළ සාමාජිකයකුට, අමාත්‍යාවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් ඕනෑම විටක දී ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර, අමාත්‍යවරයා විසින් එම ඉල්ලා අස්වීම ලිඛිතව පිළිගනු ලැබීමෙන් පසුව එම ඉල්ලා අස්වීම බලාත්මක විය යුතු ය.

(2) අමාත්‍යවරයාට ඕනෑම පත්කළ සාමාජිකයකු හේතු දක්වා ධුරයෙන් ඉවත් කළ හැකි ය. ධුරයෙන් ඉවත් කරනු ලැබූ පත්කළ සාමාජිකයකු කොමිෂන් සභාවේ සාමාජිකයකු වශයෙන් නැවත පත් කිරීමට හෝ කොමිෂන් සභාවේ වෙනත් යම් ධුරයක සේවය කිරීම සඳහා සුදුසුකම් නොලැබිය යුතු ය.

(3) මියයාම, ඉල්ලා අස්වීම හෝ ඉවත් කිරීම නිසා යම් පත්කළ සාමාජිකයකුගේ ධුරය හිස්වන අවස්ථාවක දී, අමාත්‍යවරයා විසින් 5(ආ) වගන්තියේ විධිවිධානවලට යටත්ව, එම පුරප්පාඩු පිරවීම සඳහා වෙනත් තැනැත්තෙකු පත්කළ යුතු අතර, එම තැනැත්තා ඔහුගේ අනුගාමිකයාගේ ඉකුත් නොවී ඉතිරි වී ඇති ධුර කාලය සඳහා ධුර දැරිය යුතු ය.

(4) කොමිෂන් සභාවේ යම් පත්කළ සාමාජිකයකුට, රෝගාතුරවීම හෝ වෙනත් යම් හේතුවක් හෝ මාස තුනකට නොඅඩු කාලසීමාවක් සඳහා ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා ඔහුගේ ධුරයේ කාර්ය ඉටුකිරීමට තාවකාලිකව නොහැකි වන විටක, අමාත්‍යවරයා විසින් 5(ආ) වගන්තියේ විධිවිධානවලට යටත්ව ඔහු නොපැමිණි කාලය තුළ කටයුතු කිරීම සඳහා වෙනත් තැනැත්තකු පත්කළ යුතු ය.

(5) සිය නොපැමිණීම පිළිබඳව සභාපතිවරයා කලින් දැනුවත් කිරීමෙන් තොරව කොමිෂන් සභාවේ අනුගාමී රැස්වීම් තුනකට සහභාගී වීමට අපොහොසත් වන කොමිෂන් සභාවේ යම් පත්කළ

සාමාජිකයකු, ධුරය හැරගියා සේ සැලකිය යුතු අතර, අමාත්‍යවරයා විසින් 5(ආ) වගන්තියේ විධිවිධානවලට යටත්ව එම පුරප්පාඩුව පිරවීම සඳහා වෙනත් තැනැත්තකු පත්කළ යුතු ය.

ගණපූරණය සහ කොමිෂන් සභාවේ රැස්වීම්

**10.** (1) කොමිෂන් සභාවේ යම් රැස්වීමක ගණපූරණය සාමාජිකයන් හත්දෙනෙකු විය යුතු අතර, සභාපතිවරයා කොමිෂන් සභාවේ සියලු රැස්වීම්වල මුලසුන දැරිය යුතු ය. කොමිෂන් සභාවේ යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොසිටියහොත් පැමිණ සිටින සාමාජිකයන් අතරින් තෝරා පත්කර ගනු ලබන එහි සාමාජිකයකු විසින් එම රැස්වීමේ මුලසුන දැරිය යුතු ය.

(2) කොමිෂන් සභාවේ රැස්වීමක් -

(අ) ඒ රැස්වීම සඳහා නියම කරගත් ස්ථානයේ දී, දිනයේ දී සහ වේලාවේ දී රැස්ව සිටින ගණපූරණය සංයුක්ත කරන සාමාජිකයන් සංඛ්‍යාව විසින්; හෝ

(ආ) ඒ රැස්වීම පැවැත්වෙන කාලසීමාව තුළ ඊට සහභාගි වන ගණපූරණය සංයුක්ත කරන සාමාජිකයන්ට ඊට සහභාගි වන එක් එක් සාමාජිකයන් එකවර දැකිය හැකි සහ එක් එක් සාමාජිකයාට සවන් දිය හැකි ශ්‍රව්‍ය දෘශ්‍ය සන්නිවේදනයක් මගින්,

පවත්වනු ලැබිය හැකි ය.

(3) කොමිෂන් සභාවේ යම් රැස්වීමක දී තීරණය කිරීම සඳහා ඇති සියලු ප්‍රශ්න පැමිණ සිටින සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් තීරණය කරනු ලැබිය යුතු ය. ඡන්ද ප්‍රමාණය සමාන වුවහොත් එම රැස්වීමේ සභාපතිවරයාට තම ඡන්දයට අමතරව තීරක ඡන්දයක් තිබිය යුතු ය.

(4) කොමිෂන් සභාව අවම වශයෙන් වර්ෂයකට එක් වරක්වත් රැස්විය යුතු ය. එසේ වුව ද, අවශ්‍ය වුවහොත් විශේෂ හෝ අතිවිශේෂ මහසභා රැස්වීම් කැඳවනු ලැබිය හැකි ය.

(5) මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධානවලට යටත්ව, කොමිෂන් සභාවේ රැස්වීම් පැවැත්වීම සම්බන්ධයෙන් සහ එම රැස්වීම්වල කටයුතු කිරීම සම්බන්ධයෙන් වූ කාර්ය පටිපාටිය නියාමනය කිරීම සඳහා කොමිෂන් සභාව විසින් රීති සාදනු ලැබිය හැකි ය.

කොමිෂන් සභාවේ යම් ක්‍රියාවක් හෝ කාර්ය පටිපාටියක් පුරප්පාඩුවක් පැවතීමේ හේතුව මත අවලංගු වන ලෙස නොසැලකිය යුතු බව

**11.** කොමිෂන් සභාවේ සාමාජිකත්වයේ පුරප්පාඩුවක් පැවතීමේ හෝ එහි සාමාජිකයකුගේ පත්වීමේ යම් දෝෂයක් තිබීම නොතකා කොමිෂන් සභාවට කටයුතු කළ හැකි අතර, එවැනි පුරප්පාඩුවක් හෝ පත්වීමේ දෝෂයක් පැවතීම නිසාම පමණක් එහි යම් ක්‍රියාවක් හෝ කාර්ය පටිපාටියක් අවලංගු වූ ලෙස සලකනු නොලැබිය යුතු ය.

කොමිෂන් සභාවේ සාමාජිකයන්ගේ පාරිශ්‍රමික

**12.** මුදල් විෂයය පැවරී ඇති අමාත්‍යවරයා විමසා, අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි, යම් ආකාරයකට සහ යම් අනුප්‍රමාණයක් මත කොමිෂන් සභාවේ සාමාජිකයන්ට පාරිශ්‍රමික ගෙවනු ලැබිය යුතු ය.

කොමිෂන් සභාවේ මුද්‍රාව

**13.** (1) කොමිෂන් සභාවේ මුද්‍රාව -

(අ) කොමිෂන් සභාව විසින් කලින් කල නිශ්චය කරනු ලබන යම් තැනැත්තකු භාරයේ තැබිය යුතු ය;

(ආ) කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලබන යම් ආකාරයකට වෙනස් කරනු ලැබිය හැකි ය;

(ඇ) කොමිෂන් සභාවේ අවසරය ඇතිව එහි සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී මිස, කිසිදු සාධන පත්‍රයකට හෝ ලේඛනයකට නොතැබිය යුතු අතර, ඔවුන් පැමිණි බවට සලකුණක් වශයෙන් එකී සාධන පත්‍රයේ හෝ ලේඛනයේ අත්සන් කළ යුතු ය.

(2) කොමිෂන් සභාව විසින් කොමිෂන් සභාවේ මුද්‍රාව තබන ලද සාධන පත්‍ර සහ ලේඛන පිළිබඳව රෙජිස්ටරයක් පවත්වාගෙන යා යුතු ය.

කමිටු පත් කිරීම

**14.** (1) මේ පනත මගින් කොමිෂන් සභාව වෙත පවරන ලද හෝ පනවන ලද බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී සහ ඉටු කිරීමේ දී ඊට සහාය වීම සඳහා අවශ්‍ය යැයි සැලකෙන පරිදි හෝ අවස්ථානුකූල පරිදි, අදාළ අධිකාරීන් විමසා

යම් කමිටු සහ ප්‍රවීනයන් කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පත්කරනු ලබන කමිටු පහත දැක්වෙන පරිදි විය යුතු යː-

(අ) අධ්‍යාපන කමිටුව;

(ආ) ස්වභාවික විද්‍යා කමිටුව;

(ඇ) සමාජ සහ මානව විද්‍යා කමිටුව;

(ඈ) සංස්කෘතික කමිටුව;

(ඉ) සන්නිවේදන සහ තොරතුරු කමිටුව; සහ

(ඊ) යුනෙස්කෝහි ප්‍රවීනතා ක්ෂේත්‍රයන් තුළට ගැනෙන අන්තර් අංශ කමිටුව.

(3) (1) වන උපවගන්තිය යටතේ පත්කරන ලද කමිටුවල සාමාජිකයන්, අධ්‍යාපන, විද්‍යා, තාක්ෂණ සහ නව නිපැයුම්, ආර්ථික හෝ මූල්‍ය, සංස්කෘතික, සන්නිවේදන සහ යටිතල පහසුකම්, නීති, රාජ්‍ය පරිපාලනය, ජනමාධ්‍ය, සාගර විද්‍යාව, තිරසර සංවර්ධනය, ජනමාධ්‍යවේදී, පරිසර ආරක්ෂණය, රංග කලාව, සංගීතය සහ සාහිත්‍යය, සංස්කෘතික උරුමයන් සහ කෞතුකාගාර ආදී ක්ෂේත්‍රවල හෝ වෙනත් යම් අදාළ ක්ෂේත්‍රයන් පිළිබඳ යම් සුදුසුකම් සහ ප්‍රවීණත්වය සහිත අය විය යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ පත්කරන ලද කමිටුවක් එහි රැස්වීම් පැවැත්වීම සම්බන්ධයෙන් සහ එහි කටයුතු සම්බන්ධයෙන් කාර්ය පටිපාටිය නියාමනය කරනු ලැබිය යුතු ය.

(5) (1) වන උපවගන්තිය යටතේ පත්කරන ලද සෑම කමිටුවකම සාමාජිකයන් සහ ප්‍රවීනයන් සඳහා මුදල් විෂයය පැවරී ඇති අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් දීමනාවක් ගෙවනු ලැබිය යුතු අතර, පවරන ලද කාර්යයන් ඉටු කිරීමේ දී දැරීමට සිදුවන යම් වියදම් ද ප්‍රතිපූරණය කරනු ලැබිය යුතු ය.

(6) කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබිය හැකි ආකාරයට කමිටුවල සාමාජිකයන් කොමිෂන් සභාවේ ස්ථිර සාමාජිකයන් විය හැකිය හෝ විය නොහැකි ය.

(7) කොමිෂන් සභාවේ වෙනත් යම් කමිටුවක් සමග ඒකාබද්ධව හෝ සහයෝගිතාවයෙන් කටයුතු කරන මෙන් මේ වගන්තිය යටතේ පත්කරන ලද කමිටුවකින් කොමිෂන් සභාව විසින් ඉල්ලා සිටිය හැකි ය.

කමිටුවල කාර්ය සහ කර්තව්‍ය

**15.** (1) අදාළ අමාත්‍යාංශ සහ පරදූ දරන්නන් වෙත සහායවීම සඳහා 14 වන වගන්තිය යටතේ පිහිටුවන ලද කමිටුවල කාර්ය සහ කර්තව්‍ය පහත දැක්වෙන පරිදි විය යුතු යː-

(අ) අධ්‍යාපන කමිටුව -

(i) සියල්ලන් සඳහා අධ්‍යාපනය ලබාදීම පිණිස මූලික විෂයපථ තුනක් පිළිබඳව අවධානය යොමු කිරීම, එනම්, වැඩකරන ජනතාව සඳහා සාක්ෂරතාවය, ගුරුවරුන් සහ නිපුණතා, ක්‍රියාකාරී සාක්ෂරතාව වැඩි කිරීම සඳහා සහාය වීම සහ වර්තමාන සහ අනාගත ඉල්ලීම් සපුරාලන පරිදි ගුරුවරුන් පුහුණු කිරීම සහ රඳවා තබා ගැනීම සඳහා ඵලදායී ප්‍රතිපත්ති සහ ක්‍රමවේදයන් නිර්මාණය කිරීම සහ ක්‍රියාත්මක කිරීම;

(ii) උද්ගාමී ප්‍රතිපත්ති වැඩ හරහා වැඩ කරන ජනතාව සඳහා තාක්ෂණික හා වෘත්තීමය අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීම සහ ඔවුන්ගේ පුහුණුව (TVET) සහ නිපුණතා සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම;

(iii) ඵලදායී අධ්‍යාපනික පද්ධති ගොඩනැගීම, ශක්තිමත් කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා සහාය දැක්වීම පිණිස යාවජීව ඉගෙනීමේ කටයුතු වැඩි දියුණු කරමින් මුල් ළමා වියෙහි සිට වැඩිහිටි විය දක්වා අධ්‍යාපනය පිළිබඳ විවිධ අදියරවල දී හැකියාව සංවර්ධනය කිරීම, තාක්ෂණික සහාය සහ ප්‍රතිපත්තිමය උපදෙස් ලබා දීම;

(iv) අධ්‍යාපන ප්‍රතිපත්ති ඇතුළුව පුළුල් සැලසුම් සකස් කිරීමේ දී, අලුත් කිරීමේ දී සහ කළමනාකරණය කිරීමේ

දී ඊට සහාය වීම සහ සම්පූර්ණ අධ්‍යාපන ක්ෂේත්‍රයට බලපෑ හැකි සෞඛ්‍යමය, පාරිසරික, ආර්ථිකමය සහ සමාජයීය ආදී ප්‍රශ්නවලට විසඳුම් ඉදිරිපත් කිරීම;

(v) මුල් ළමාවිය රැකවරණයේ සිට උසස් අධ්‍යාපනය දක්වා අධ්‍යාපන ක්ෂේත්‍රය ආවරණය කරමින් ගෝලීය මට්ටමින් සහ දේශීය මට්ටමින් යුනෙස්කෝහි නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා තොරතුරු සැපයීම සහ ආධාර ලබා දීම;

(vi) යුනෙස්කෝ ආයතනයට අයත් අධ්‍යාපනය පිළිබඳ 1 වන වර්ගයේ ආයතන වන යුනෙස්කෝ ජාත්‍යන්තර අධ්‍යාපන කාර්යාංශය (IBE), අධ්‍යාපනික සැලසුම් සඳහා වූ යුනෙස්කෝ ජාත්‍යන්තර ආයතනය (IIEP), යාවජීව ඉගෙනීම සඳහා වූ යුනෙස්කෝ ආයතනය (UIL), සහ අධ්‍යාපනයේ තොරතුරු තාක්ෂණ සඳහා වූ යුනෙස්කෝ ආයතනය (IITE) යන ආයතනයන්හි සහාය ලබා ගැනීම.

(ආ) ස්වභාවික විද්‍යා කමිටුව -

(i) (අ) ඒකාබද්ධ විද්‍යාත්මක, තාක්ෂණික සහ නිර්මාණාත්මක ප්‍රතිපත්ති හරහා විද්‍යාවේ බලපෑම වැඩි කිරීම මගින්; සහ

(ආ) මූලික ඉංජිනේරු ශිල්පය සහ ව්‍යවහාරික විද්‍යාවන්ට අදාළ විද්‍යාව, අධ්‍යාපනය සහ හැකියා ප්‍රවර්ධනය ශක්තිමත් කිරීම මගින්,

තිරසර සංවර්ධනය සහ දිළිඳු බව තුරන් කිරීම සඳහා විද්‍යාව, තාක්ෂණය සහ නිර්මාණාත්මක ප්‍රතිපත්තිමය උපදෙස් ලබාදීම සහ හැකියාවන් ගොඩනැගීම;

(ii) (අ) පිරිසිදු ජලය, භෞමික සම්පත් සහ ජෛව විවිධත්වය මෙන්ම ආපදා ප්‍රත්‍යස්ථිතිකත්වය තිරසර ලෙස කළමනාකරණය කිරීම සහ සංරක්ෂණය කිරීම, ප්‍රවර්ධනය කිරීම හරහා; සහ

(ආ) සමුද්‍ර සහ වෙරළ කලාප කළමනාකරණය සහ ආරක්ෂා කිරීම සඳහා පාලනය වැඩි දියුණු කිරීම සහ රාජ්‍යයන් අතර සහයෝගිතාව වර්ධනය කිරීම හරහා,

පිරිසිදු ජලය, සමුද්‍ර සහ භෞමික සම්පත් තිරසර ලෙස කළමනාකරණය කිරීම සඳහා මෙන්ම ආපදා සඳහා සූදානම්ව සිටීම සහ ගෝලීය උණුසුම සහ දේශගුණික විපර්යාසයන්හි බලපෑම අඩු කිරීම සඳහා ශක්‍යතාවන් වර්ධනය කිරීම;

(iii) අදාළ විද්‍යා ක්ෂේත්‍රවලට වැදගත් දායකත්වයක් ලබා දීමේ අදහස ඇතිව යුනෙස්කෝහි, යුනෙස්කෝ ජල අධ්‍යාපන ආයතනය (IWE), න්‍යායාත්මක භෞතික විද්‍යාව සඳහා වූ ජාත්‍යන්තර මධ්‍යස්ථානය (ICTP) සහ යුනෙස්කෝහි විශේෂිත වැඩසටහන් සහ කොමිෂන් සභා එනම්, ජාත්‍යන්තර සාගර විද්‍යා කොමිසම (IOC), ජාත්‍යන්තර ජල විද්‍යා වැඩසටහන (IHP), ජාත්‍යන්තර භූ විද්‍යා සහබන්ධන වැඩසටහන (MAB) සහ මිනිසා සහ ජෛවගෝල වැඩසටහන (MAB) හි සහාය ලබාගැනීම;

(iv) සියලු ප්‍රධාන පාර්ශ්වයන් අතර වැඩිදියුණු කළ සම්බන්ධතා ඇති කිරීම පිණිස තිරසර සංවර්ධනය සඳහා වූ විද්‍යාත්මක හා තාක්ෂණික ක්ෂේත්‍රවල ද්විපාර්ශ්විකයන් වැඩි ගණනක් ඇතුළු රාජ්‍ය, පෞද්ගලික සහ රජයේ පරදු දරන්නන් අතර සහභාගිත්වය වැඩිදියුණු කිරීම.

(ඇ) සමාජ හා මානව විද්‍යා කමිටුව -

(i) (අ) උද්ගත වන සමාජ ප්‍රශ්න මත සාකච්ඡා ඇති කිරීම තුළින් අධ්‍යාපනය, විද්‍යාව, සංස්කෘතිය, ජනමාධ්‍ය සහ සන්නිවේදනය පිළිබඳ වැඩසටහන් හරහා මානව අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම මගින්;

(ආ) සංක්‍රමණික ශ්‍රම බලකාය සහ වේගවත් නාගරීකරණය පිළිබඳ ප්‍රශ්න ද ආවරණය විය

හැකි පරිදි ප්‍රතිපත්ති සාදන්නන් සහ පර්යේෂණ ප්‍රජාව අතර සාකච්ඡා පැවැත්වීම හරහා ජාතික, ප්‍රාදේශීය සහ ජාත්‍යන්තර මට්ටම්වලින් පැන නැගීමට ඉඩ ඇති මූල්‍යමය සහ ආර්ථික අර්බුදවල සාමාජීය බලපෑමට විද්‍යාත්මක ප්‍රතිපත්තිමය ප්‍රතිචාර දැක්වීමේ අදහස ඇතිව සමාජ වෙනස්වීම් පිළිබඳ ක්ෂේත්‍රයේ පර්යේෂණ හා ප්‍රතිපත්ති සම්බන්ධතා ශක්තිමත් කිරීම මගින්; සහ

(ඇ) ශාරීරික අධ්‍යාපනය, ක්‍රීඩා සහ මත්ද්‍රව්‍ය විරෝධී ප්‍රතිපත්ති ප්‍රවර්ධනය කිරීම මගින්,

ජාතික, ප්‍රාදේශීය සහ විශ්ව සාමාජීය තියුණු අභියෝගවලට ප්‍රතිචාර දැක්වීම; සහ

(ii) විද්‍යා සහ තාක්ෂණය සඳහා සහ විශේෂයෙන් ම ජෛව ආචාර ධර්ම සඳහා ආචාර ධර්ම පිළිබඳ ප්‍රතිපත්ති ප්‍රවර්ධනය කිරීම මගින් ආචාර ධර්ම පිළිබඳ ලොව පුරා පැනනගින ප්‍රශ්න පිළිබඳව අවධානය යොමු කිරීම.

(ඈ) සංස්කෘතික කමිටුව -

(i) (අ) ලෝක උරුමයන් පිළිබඳ සම්මුතියේ මාර්ගෝපදේශ ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම හරහා සංස්කෘතික සහ ස්වභාවික උරුම දේපළ ආරක්ෂා කිරීම සහ සංරක්ෂණය කිරීම මගින්;

(ආ) මිත්‍යා විශ්වාස, ඇදහිලි, පිළිවෙත්, පුරුදු, සංස්කෘතික පරාසයන්, පෙරහැර, නැටුම්, නාට්‍ය කලාව, රංග කලාව, සජ්ඣායනා සහ සන්නිවේදන ක්‍රම වැනි ක්ෂේත්‍ර ආවරණය වන, විශේෂයෙන් ම ප්‍රත්‍යක්ෂ සංස්කෘතික උරුමයන් පිළිබඳ 2003 යුනෙස්කෝ සම්මුතියේ මාර්ගෝපදේශ ප්‍රවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම හරහා ජීවමාන උරුමයන් ආරක්ෂා කිරීම මගින්;

(ඇ) විශේෂයෙන් ම 1970 සහ 2001 යුනෙස්කෝ සම්මුති ප්‍රවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම

මගින් මෙන්ම කෞතුකාගාර සංවර්ධනය කිරීම මගින් සංස්කෘතික වස්තුන්වල ආරක්ෂාව වැඩි කිරීම සහ ඒවායෙහි නීති විරෝධී ජාවාරම් කිරීමට එරෙහිව ආරක්ෂාව වැඩි දියුණු කිරීම මගින්;

(ඈ) 2001 එක්සත් ජාතීන්ගේ සම්මුතිය ක්‍රියාත්මක කිරීම හරහා දිය යට සංස්කෘතික උරුමයන් ආරක්ෂා කිරීම මගින්,

ප්‍රත්‍යක්ෂ හා ප්‍රත්‍යක්ෂ නොවන සංස්කෘතික උරුමයන් ආරක්ෂා කිරීම, රැකගැනීම සහ කළමනාකරණය කිරීම**.**

(ii) (අ) සංස්කෘතික ප්‍රකාශන පිළිබඳ විවිධත්වය ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා වූ 2005 යුනෙස්කෝ සම්මුතියේ මාර්ගෝපදේශ ක්‍රියාත්මක කිරීම හරහා සහ සංස්කෘතික හා නිර්මාණාත්මක කර්මාන්ත සංවර්ධනය කිරීම හරහා;

(ආ) සාකච්ඡා සහ විවිධත්වය ප්‍රවර්ධනය කිරීම සහ සංවර්ධන කටයුතුවල දී සංස්කෘතියේ කාර්යභාරය ඉදිරියට ගෙන ඒම සඳහා අන්තර් සංස්කෘතික සාකච්ඡා සහ සංස්කෘතික විවිධත්වය ජාතික ප්‍රතිපත්තිවලට ඇතුළත් කිරීම හරහා,

සාමයේ සංස්කෘතියක් පෝෂණය කිරීම සඳහා සංස්කෘතික ප්‍රකාශනවල විවිධත්වය සහ සංස්කෘතික සාකච්ඡා ප්‍රවර්ධනය කිරීම.

(ඉ) සන්නිවේදන කමිටුව -

(i) පක්ෂ හිතත්වය සහ අධීක්ෂණය හරහා තොරතුරුවලට ප්‍රවේශවීම වැඩි කිරීම මගින් අදහස් ප්‍රකාශ කිරීමේ සහ තොරතුරු දැන ගැනීමේ නිදහස ප්‍රවර්ධනය කිරීම;

(ii) (අ) මාධ්‍ය අන්තර්ගතය සහ තොරතුරු සාක්ෂරතාව වැඩි කිරීම මගින් සහ තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම ප්‍රවර්ධනය කිරීම මගින් තිරසර

සංවර්ධනය සඳහා නිදහස්, ස්වාධීන සහ බහු මාධ්‍ය සහ සන්නිවේදනය ශක්තිමත් කිරීම හරහා;

(ආ) උචිත තොරතුරු ව්‍යුහයන් සහ මාධ්‍ය සම්පත් පුහුණු මධ්‍යස්ථාන සංවර්ධනය කිරීම මගින් සහ දැනුම අත්පත් කර ගැනීමේ දී සහ හුවමාරු කර ගැනීමේ දී තොරතුරු තාක්ෂණය භාවිත කිරීම මගින්, විශ්ව තොරතුරුවලට ප්‍රවේශය සහ දැනුම පෝෂණය කිරීම හරහා,

විශ්ව තොරතුරුවලට හා දැනුමට ප්‍රවේශය ලබා ගැනීම සඳහා හැකියාවන් වර්ධනය කිරීම.

(ඊ) අන්තර් අංශ කමිටුව විසින්, අධ්‍යාපනය, විද්‍යාව, සංස්කෘතිය, ජනමාධ්‍ය සහ සන්නිවේදනය සඳහා වන ජාතික ආයතන සහයෝගීතාවයෙන් සහ සහභාගීත්වයෙන් යුනෙස්කෝ සමඟ සම්බන්ධීකරණය කිරීම.

(2) කමිටුවල කාර්ය හා කර්තව්‍ය, කිරීම සහ ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි දැනුම සහ ප්‍රවීනතාව සහිත වෙනත් තැනැත්තන් අනුයුක්ත කර ගැනීමට ඕනෑම කමිටුවකට හැකි ය.

II වන කොටස

**කොමිෂන් සභාවේ මහලේකම්, නියෝජ්‍ය මහලේකම් සහ කාර්ය මණ්ඩලය පත් කිරීම**

කොමිෂන් සභාවේ මහලේකම්වරයා පත්කිරීම

**16.** (1) අධ්‍යාපනය, ස්වභාවික විද්‍යාව, සමාජ සහ මානව විද්‍යාව, සංස්කෘතිය, සන්නිවේදනය හෝ පරිපාලනය යන ක්ෂේත්‍රවල අවුරුදු පහළොවකට වඩා නොඅඩු ශාස්ත්‍රීය හෝ වෘත්තීමය පළපුරුද්ද ඇති තැනැත්තෙකු අමාත්‍යවරයා විසින් කොමිෂන් සභාවේ මහලේකම්වරයා වශයෙන් පත්කරනු ලැබිය යුතු ය.

(2) මහලේකම්වරයා කොමිෂන් සභාවේ ප්‍රධාන විධායක නිලධරයා විය යුතු අතර, පහත සඳහන් කාර්යයන් ඇතුලුව කොමිෂන් සභාවේ කටයුතු සම්බන්ධයෙන් වගකිව යුතු යː-

(අ) කොමිෂන් සභාවේ එදිනෙදා ක්‍රියාකාරකම්;

(ආ) කොමිෂන් සභාවේ අරමුදල් පරිපාලනය;

(ඇ) කොමිෂන් සභාවේ දේපළ පරිපාලනය සහ කළමනාකරණය; සහ

(ඈ) කොමිෂන් සභාවේ නිලධාරීන් සහ වෙනත් කාර්ය මණ්ඩල අධීක්ෂණය සහ පාලනය.

(3) මහලේකම්වරයා විසින්, කොමිෂන් සභාවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ, කිරීමේ සහ ඉටු කිරීමේ කාර්ය සඳහා ඔහු විසින් අවශ්‍ය යයි සලකනු ලබන වැඩසටහන් හා ක්‍රමවේද අමාත්‍යවරයාට සලකා බැලීම සඳහා ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(4) කොමිෂන් සභාවේ හෝ මේ පනත යටතේ පිහිටුවන ලද වෙනත් යම් කමිටුවක යම් රැස්වීමකට පැමිණීමට, කථා කිරීමට සහ ඡන්දය දීමට මහලේකම්වරයාට හිමිකම ඇත්තේ ය.

(5) මහලේකම්වරයා සිය කාර්ය සහ කර්තව්‍ය කිරීමේ දී සහ ඉටු කිරීමේ දී ඔහු විසින් ප්‍රමාණවත් විනිවිදභාවයක් පවත්වාගෙන යන බවට සහතික විය යුතු ය.

(6) මහලේකම්වරයා විසින්, තුන් අවුරුදු වැඩ සැලැස්ම, වාර්ෂික සැලැස්ම සහ වැඩ සටහන සහ වාර්ෂික අයවැය එකඟතාව සඳහා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු ය.

(7) අමාත්‍යවරයා විසින්, මුදල් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා විමසා තීරණය කරනු ලැබිය හැකි යම් ආකාරයකට සහ යම් අනුප්‍රමාණයකින් මහලේකම්වරයා වෙත පාරිශ්‍රමික ගෙවනු ලැබිය හැකි ය.

**කොමිෂන් සභාවේ නියෝජ්‍ය මහලේකම්වරයා පත් කිරීම**

**17.** (1) අමාත්‍යවරයා විසින් අධ්‍යාපනය, ස්වභාවික විද්‍යාව, සමාජ සහ මානව විද්‍යාව, සංස්කෘතිය, සන්නිවේදනය හෝ පරිපාලනය යන ක්ෂේත්‍රවල අවුරුදු දහයකට වඩා නොඅඩු ශාස්ත්‍රීය හෝ වෘත්තීමය පළපුරුද්දක් ඇති තැනැත්තකු කොමිෂන් සභාවේ නියෝජ්‍ය මහලේකම්වරයා වශයෙන් පත්කරනු ලැබිය යුතු ය.

(2) නියෝජ්‍ය මහලේකම්වරයා කොමිෂන් සභාවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම සඳහා මහලේකම්වරයාට සහාය විය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින්, මුදල් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා විමසා තීරණය කරනු ලැබිය හැකි යම් ආකාරයකට සහ යම් අනුප්‍රමාණයකින් නියෝජ්‍ය මහලේකම්වරයා වෙත පාරිශ්‍රමික ගෙවනු ලැබිය හැකි ය.

මහලේකම්වරයාගේ සහ නියෝජ්‍ය මහලේකම්වරයාගේ ධුර කාලය

**18.** (1) මහලේකම්වරයා සහ නියෝජ්‍ය මහලේකම්වරයා අවුරුදු තුනක කාලයක් සඳහා ධුර දැරිය යුතු අතර නැවත පත්කරනු ලැබීම සඳහා සුදුස්සකු විය යුතු ය.

(2) අමාත්‍යවරයා විසින් තත්කාර්ය සඳහා හේතු දක්වා මහලේකම්වරයා හෝ නියෝජ්‍ය මහලේකම්වරයා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(3) මිය යාම, ධුරයෙන් ඉවත් කිරීම හෝ තත්කාර්ය සඳහා අමාත්‍යවරයා අමතන ලද ලිපියක් මගින් ඉල්ලා අස්වීම මගින් මහලේකම්වරයාගේ සහ නියෝජ්‍ය මහලේකම්වරයාගේ ධුරය පුරප්පාඩු වන්නේ ය.

(4) මහලේකම් ධුරය පුරප්පාඩු වූ අවස්ථාවක, එම ධුරයට පත්කිරීමක් සිදු කරන තෙක් අමාත්‍යවරයා විසින් මහලේකම්වරයාගේ කාර්ය ඉටු කිරීම සඳහා නියෝජ්‍ය මහලේකම්වරයා පත් කරනු ලැබිය හැකි ය.

කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය පත් කිරීම

**19.** (1) කොමිෂන් සභාව විසින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පූර්ව ලිඛිත අවසරය ඇතිව එහි බලතල සහ කර්තව්‍ය කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි බවට සලකන යම් නිලධාරීන් සහ සේවා නියුක්තිකයන් සංඛ්‍යාවක් පත්කරනු ලැබිය හැකි ය.

(2) කොමිෂන් සභාව විසින් (1) වන උපවගන්තිය යටතේ පත්කරන ලද එහි නිලධරයන් සහ සේවා නියුක්තිකයන් සම්බන්ධයෙන් විනය ක්‍රියාත්මක කිරීම හෝ සේවයෙන් ඉවත් කිරීම සහ එවැනි නිලධාරීන් සහ සේවා නියුක්තිකයන්ගේ සේවා නියුක්තියේ නියම සහ කොන්දේසි නිශ්චය කිරීම කරනු ලැබිය හැකි ය.

(3) මුදල් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා විමසා කොමිෂන් සභාවේ නිලධාරීන් සහ සේවා නියුක්තිකයන්ට කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන යම් ආකාරයකට සහ යම් අනුප්‍රමාණයකට පාරිශ්‍රමික ගෙවිය යුතු අතර මේ පනතේ විධිවිධාන

සහ ඒ යටතේ සාදන ලද රීතිවලට අනුකූලව කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබිය හැකි යම් සේවා කොන්දේසිවලට යටත් විය යුතු ය.

(4) කොමිෂන් සභාව විසින් රජයේ සේවයට පිටතින් කොමිෂන් සභාවට බඳවාගනු ලැබිය හැකි යම් නිලධාරීන් සහ සේවා නියුක්තිකයන්ගේ යහපත සඳහා අර්ථසාධක අරමුදල් යෝජනා ක්‍රම පිහිටුවීම සහ නියාමනය කිරීම කළ හැකි අතර, එවැනි යම් යෝජනා ක්‍රම සඳහා දායකත්වය සැපයීම කළ හැකි ය.

කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට රාජ්‍ය සේවකයන් පත්කිරීම

**20.** (1) මහලේකම්වරයාගේ ඉල්ලීම පිට සහ අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව රජයේ සේවයේ යම් නිලධරයකු එම නිලධරයාගේ සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කැමැත්ත ඇතිව කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන කාලසීමාවක් සඳහා කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත්කරනු ලැබිය හැකි ය. නැතහොත් ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(2) රාජ්‍ය සේවයේ යම් නිලධරයකු කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත්කරනු ලැබූ අවස්ථාවක 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව ඒ නිලධරයාට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(3) රාජ්‍ය සේවයේ යම් නිලධරයකු කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත්කරනු ලැබූ අවස්ථාවක දී, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව එම නිලධරයාට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

උසස් අධ්‍යාපන ආයතනවලින් කොමිෂන් සභාවට නිලධාරීන් පත් කිරීම

21. (1) කොමිෂන් සභාවේ ඉල්ලීම පරිදි 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ පිහිටුවන ලද උසස් අධ්‍යාපන ආයතනයක යම් නිලධරයකු හෝ වෙනත් සේවා නියුක්තිකයකු එම නිලධරයාගේ හෝ සේවා නියුක්තිකයාගේ සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ එම උසස් අධ්‍යාපන ආයතනයේ ප්‍රධාන විධායක නිලධරයාගේ කැමැත්ත ඇතිව කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලබන කාලසීමාවක් සඳහා කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත්කරනු ලැබිය හැකි අතර එවැනිම කැමැත්ත ඇතිව එම නිලධරයා හෝ සේවා නියුක්තිකයා කොමිෂන් සභාව සහ එම ප්‍රධාන විධායක නිලධරයා විසින් එකඟවන විශ්‍රාම

වැටුප් සහ අර්ථසාධක අරමුදල් අයිතිවාසිකම්වලට අදාළ කොන්දේසි මත එම කාර්ය මණ්ඩලයට ස්ථිරව පත්කරනු ලැබිය හැකි ය.

(2) යම් තැනැත්තකු (1) වන උපවගන්තිය යටතේ කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලබන අවස්ථාවක දී එම තැනැත්තා කොමිෂන් සභාවේ වෙනත් යම් සාමාජිකයකු යටත් වන විනය පාලනයට ම යටත් විය යුතු ය.

III වන කොටස

මුදල්

**22.** කොමිෂන් සභාවේ ආරම්භක ප්‍රාග්ධනය - කොමිෂන් සභාවේ ප්‍රාග්ධනය

(අ) යෝජනා සම්මතයක් මගින් පාර්ලිමේන්තුව විසින් තීරණය කරනු ලබන මුදලක් විය යුතු ය;

(ආ) විසර්ජන පනතක් මගින් හෝ පාර්ලිමේන්තුවේ යම් යෝජනා සම්මතයක් මගින් අනුමත කරන මුදල් ප්‍රමාණයකින් වැඩිකරනු ලැබිය හැකි ය.

**23.** (1) කොමිෂන් සභාවට එහිම අරමුදලක් තිබිය යුතු ය. කොමිෂන් සභාවේ අරමුදල

(2) කොමිෂන් සභාවේ අරමුදල පහත දැක්වෙන මුදල්වලින් සමන්විත විය යුතු යː-

(අ) පාර්ලිමේන්තුව විසින් කලින් කල සම්මත කරනු ලබන සියලුම මුදල්;

(ආ) ආයෝජන මත ලැබෙන පොලිය, ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත කවර හෝ ප්‍රභවයකින් ලැබෙන පරිත්‍යාග, ත්‍යාග හෝ ප්‍රදාන වශයෙන් කොමිෂන් සභාවට ලැබෙන සියලු මුදල්ː

එසේ වුව ද, සෑම විදේශීය ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග සම්බන්ධයෙන් මුදල් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යාංශයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ පූර්ව ලිඛිත අනුමතය ලබාගත යුතු අතර, ශ්‍රී ලංකාවේ යම් ප්‍රභවයකින් ලැබෙන ණය, පරිත්‍යාග, ත්‍යාග, රික්තවරණ සහ ප්‍රදාන ඒකාබද්ධ අරමුදලට බැරවිය යුතු අතර ඉන් පසුව පාර්ලිමේන්තුවේ අනුමතය ඇතිව කොමිෂන් සභාවේ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය;

(ඇ) කොමිෂන් සභාව විසින් සිදු කරනු ලබන ආයෝජන මත ලැබෙන සියලුම ආදායම් මුදල්.

(3) කොමිෂන් සභාවේ අරමුදලින් පහත දැක්වෙන මුදල් ගෙවිය යුතු යː-

(අ) මේ පනත යටතේ කොමිෂන් සභාව විසින් ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය, ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී සහ ඉටු කිරීමේ දී කොමිෂන් සභාව විසින් දරනු ලබන වියදම් පියවීම සඳහා අවශ්‍ය සියලු මුදල්; සහ

(ආ) මේ පනත මගින් හෝ එය යටතේ අරමුදලින් ගෙවිය යුතු බවට නියම කර ඇති සියලු මුදල්.

කොමිෂන් සභාව විසින් ගිණුම් පවත්වාගෙන යාම

**24.** කොමිෂන් සභාව විසින්, සුදුසු යැයි හැඟෙන ආකාරයකට ඕනෑම බැංකුවක යම් ගිණුමක් ආරම්භ කර පවත්වාගෙන යා හැකි අතර, එම ගිණුම රජයේ පවත්නා මූල්‍ය රෙගුලාසිවලට අනුකූලව ක්‍රියාත්මක කළ යුතු ය.

කොමිෂන් සභාවේ මුදල් ආයෝජනය කිරීම

**25.** කොමිෂන් සභාවේ මුදල් කොමිෂන් සභාව විසින් යම් ආකාරයකට ආයෝජනය කරනු ලැබිය හැකි අතර, අමාත්‍යවරයා විසින් ලබාදෙනු ලබන යම් විධානවලට යටත්ව තීරණය කරනු ලැබිය හැකි පරිදි එවැනි ආයෝජනවලින් උපචිත වන ආදායම එකතු කරනු ලැබිය හැකි ය.

කොමිෂන් සභාවේ මුදල් වර්ෂය හා ගිණුම් විගණනය

**26.** (1) කොමිෂන් සභාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) කොමිෂන් සභාවේ ආදායම සහ වියදම, වත්කම් හා බැරකම් සහ වෙනත් සියලු ගනුදෙනු සම්බන්ධයෙන් නිසි පරිදි ගිණුම් පොත් තැබීමට කොමිෂන් සභාව විසින් කටයුතු සැලැස්විය යුතු ය.

(3) රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනය කිරීමට අදාළව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන කොමිෂන් සභාවේ ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

## IV වන කොටස

### සාමාන්‍ය

**අමාත්‍යවරයාගේ විධාන**

**27.** (1) කොමිෂන් සභාවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම පිළිබඳව අමාත්‍යවරයා විසින් කලින් කල කොමිෂන් සභාව වෙත සාමාන්‍ය හෝ විශේෂ විධාන ලිඛිතව ලබා දිය හැකි අතර, එම විධානවලට අනුකූලව ක්‍රියා කිරීම කොමිෂන් සභාවේ කාර්යභාරය වන්නේ ය.

(2) අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන යම් තැනැත්තකුට හෝ තැනැත්තන්ට, කොමිෂන් සභාවේ කටයුතු සියල්ල හෝ ඉන් යම් කටයුත්තක් විමර්ශනය කර ඒ පිළිබඳව වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස නියම කරනු ලැබිය හැකි අතර, එවැනි නියමයක් කරනු ලැබීමේ දී, එම නියමය බලාත්මක කිරීම සඳහා යම් තැනැත්තකුට හෝ තැනැත්තන්ට අවශ්‍ය විය හැකි සියලු පහසුකම් කොමිෂන් සභාව විසින් ලබා දිය යුතු අතර, ඒ සඳහා අවශ්‍ය තොරතුරු සියල්ල ඉදිරිපත් කළ යුතු ය.

**කොමිෂන් සභාවේ වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු බව**

**28.** සෑම මුදල් වර්ෂයක් ම අවසන්වීමෙන් පසු මාස හයක කාලයක් ඇතුළත අදාළ වර්ෂය තුළ සිදු වූ කොමිෂන් සභාවේ කටයුතු පිළිබඳ සම්පූර්ණ වාර්තාවක් කොමිෂන් සභාව විසින් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුතු අතර, අමාත්‍යවරයා විසින්, එම වාර්තාව අදාළ වන වර්ෂයට පසුව එළඹෙන වර්ෂය අවසන්වීමට පෙර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

**කොමිෂන් සභාවේ සාමාජිකයන් සහ එහි නිලධරයන් සහ සේවා නියුක්තිකයන් රාජ්‍ය සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු බව**

**29.** (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහය පනතේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා කොමිෂන් සභාවේ සියලු සාමාජිකයන් සහ එහි නිලධරයන් හා සේවා නියුක්තිකයින් රාජ්‍ය සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

**30.** (26 වන අධිකාරය වූ) අල්ලස් පනතේ අර්ථානුකූලව කොමිෂන් සභාව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ පනතේ විධිවිධාන ඒ අනුව තේරුම්ගනු ලැබිය යුතු ය.

අල්ලස් පනතේ අර්ථානුකූලව කොමිෂන් සභාව උපලේඛනගත ආයතනයක් විය යුතු බව

**31.** (1) යම් අධිකරණයක් ඉදිරිපිට කොමිෂන් සභාව විසින් හෝ එයට එරෙහිව පවරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී කොමිෂන් සභාව විසින් දරන ලද යම් වියදමක් කොමිෂන් සභාවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු අතර, යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී කොමිෂන් සභාවට ලැබුණ හෝ අයකරගනු ලැබූ යම් ගාස්තුවක් කොමිෂන් සභාවේ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

මේ පනත යටතේ හෝ කොමිෂන් සභාවේ විධාන යටතේ කරන ලද ක්‍රියා සඳහා ආරක්ෂාව

(2) මේ පනත යටතේ හෝ කොමිෂන් සභාවේ විධානය මත යම් තැනැත්තකු විසින් කරන ලද යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් එම තැනැත්තාට එරෙහිව යම් අධිකරණයක් ඉදිරියේ පවරා ඇති සිවිල් හෝ අපරාධ නඩුවක දී එම තැනැත්තා විසින් දරන ලද වියදම් එම සිවිල් හෝ අපරාධ නඩුවේ දී එම තැනැත්තා විසින් අයකර ගනු ලැබුවහොත් මිස, එකී මුදල් කොමිෂන් සභාවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

**32.** (1) කොමිෂන් සභාව විසින්-

රීති

(අ) නිලධරයන්ගේ පත් කිරීම, සේවා නියුක්තිය සහ සේවයෙන් පහ කිරීම සහ ඔවුන්ගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය;

(ආ) කොමිෂන් සභාවේ රැස්වීම්, වාර්ෂික මහ සභා රැස්වීම් සහ විශේෂිත රැස්වීම් පැවැත්වීමේ දී සහ කැඳවීමේදී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය;

(ඇ) කොමිෂන් සභාවේ කටයුතුවල පරිපාලනය සහ කළමනාකරණය;

(ඈ) මේ පනත යටතේ රීති සෑදීම සඳහා නියම කර ඇති හෝ බලය ලබා දී ඇති සියලුම කාරණා සම්බන්ධයෙන්,

රීති සාදනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ සාදනු ලබන සෑම රීතියක් ම අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබිය යුතු ය.

(3) එසේ අනුමත කරනු ලබන සෑම රීතියක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරනු ලැබූ දින සිට ක්‍රියාත්මක විය යුතු ය.

නියෝග

**33.** (1) අමාත්‍යවරයා විසින්, මේ පනත මගින් නියම කරනු ලැබිය යුතු යැයි නියමිත හෝ නියෝග සෑදීමට බලය දී ඇති කාරණා සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතු අතර එකී පළකරනු ලබන දින සිට හෝ එම නියෝගයේ නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි යම් පසු දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසු මාස තුනක කාලසීමාවක් ඇතුළත අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු ය. එසේ අනුමත නොකරන ලද යම් නියෝගයක් ඒ යටතේ කලින් කරන ලද කිසිවකට අගතියක් නොමැතිව එකී අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) (3) වන උපවගන්තිය යටතේ පරිච්ඡින්න වූ ලෙස සලකනු ලබන යම් නියෝගයක්, එසේ පරිච්ඡින්න වූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනයක්, ගැසට් පත්‍රයේ පළකරනු ලැබිය යුතු ය.

අර්ථ නිරූපණය

**34.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ පනතේ-

"ප්‍රවීනයකු" යන්නෙන්, යුනෙස්කෝ වැඩසටහන්වල කුමන හෝ ක්ෂේත්‍රයක විශේෂඥ දැනුමක් සහිත වෘත්තිකයකු අදහස් වේ;

"අමාත්‍යවරයා" යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වන හෝ 45 වන ව්‍යවස්ථා යටතේ අධ්‍යාපන විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා අදහස් වේ;

"යුනෙස්කෝ" යන්නෙන්, එක්සත් ජාතීන්ගේ අධ්‍යාපනික, විද්‍යාත්මක සහ සංස්කෘතික සංවිධානය අදහස් වේ;

"යුනෙස්කෝ වැඩසටහන්" යන්නෙන්, යුනෙස්කෝ ශක්‍යතා ක්ෂේත්‍ර පහ අදහස් වන අතර අධ්‍යාපනය, ස්වභාවික විද්‍යාව, සමාජ සහ මානව විද්‍යාව, සංස්කෘතිය සහ සන්නිවේදනය සහ තොරතුරු ඊට ඇතුළත් වේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**35.** මෙම පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.